**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය - 2022**

**-----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රීලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, ඊට සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම් ව ගිණුම්කරණ සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයට අනුව, මණ්ඩලයේ ප්‍රධාන ආදායම් මාර්ගය රජයේ ප්‍රදාන වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂය තුළ රු. 5,778,569 කින් හෝ සියයට 08 කින් වැඩි වී තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මුළු වියදම රු. 5,778,569 කින් හෝ සියයට 08 කින් වැඩි වී තිබුණි. එකතුව රු. 52,907,286 ක් වූ කාර්ය මණ්ඩල පිරිවැය සහ ගොඩනැගිලි කුලිය සමාලෝචිත වර්ෂය සඳහා වූ මුළු වියදමෙන් සියයට 69 ක් නියෝජනය කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ මුළු වියදමෙන් සියයට 68 ට සාපේක්ෂව වැඩි වී තිබුණි. විස්තර පහත සඳහන් පරිදි වේ.

| අයිතමය | වර්ෂය සඳහා 2022 | 2021 | වැඩිවීම / (අඩුවීම) රු. | % |
|---|---|---|---|---|
| | රු. | රු. | | |
| මුළු වියදම | 77,015,260 | 71,236,691 | 5,778,569 | 08 |
| - කාර්ය මණ්ඩල පිරිවැය<br>- ගොඩනැගිලි කුලිය | 52,907,286 | 48,358,393 | | |
| මුළු වියදමේ ප්‍රතිශතය (%) | 69 | 68 | | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනතට අනුව, අස්තිත්ව 1,671ක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBEs) ලෙස හඳුනා ගන්නා ලදී. කෙසේ වුවද, මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන 550 ක සැලසුම් සහගත සමාලෝචන අතරින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 552 සහ 541 ක සමාලෝචන අනුපිළිවෙළින් 2021 සහ 2022 වර්ෂ තුළ සම්පූර්ණ කර තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල සැලසුම්ගත සහ සත්‍ය සමාලෝචනවල පිරිහීමට හේතුව මණ්ඩලය තුළ අඛණ්ඩව පවතින තාක්ෂණික කාර්ය මණ්ඩලයේ අඩුවීම බව නිරීක්ෂණය විය. | පවතින සම්පත් සමඟ ප්‍රශස්ත මට්ටමක් මත පදනම්ව මෙම ඉලක්ක සකසා ඇත. වැටුප් ප්‍රශ්නය නොවිසඳීම හේතුවෙන් කාර්යසාධනය අඩුවෙමින් පවතින බව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් වසර ගණනාවක් මුළුල්ලේ අමාත්‍යාංශය වෙත දන්වා ඇත. කෙසේ වුවද, මේ දක්වා වැටුප් ගැටළුව සම්බන්ධයෙන් ප්‍රගතියක් ලබා නොමැත. | මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව වැඩි කළ යුතු වීම. |

### 3.2 ව්‍යාපෘතිවල ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර කටයුතු සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා උපදේශන සේවා වෙනුවෙන් සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැයෙන් සියයට 7 ක මුදලක් වන පිරිවැයක් යටතේ 2019 ජනවාරි 30 වැනි දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමක් ඇති කර ගෙන තිබුණි. ඉදිකිරීම් සංවර්ධන අදියර අවසන් කර 2021 ඔක්තෝබර් 27 දින උපදේශන බිල්පතෙන් සියයට 65 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, උපදේශන සේවාවල ඉතිරි වැඩ අදියර හෝ පරිශ්‍රයේ යෝජිත වැඩිදියුණු කිරීම් විගණිත දිනය වූ 2023 මැයි 25 වන විටත් අවසන් කර නොතිබුණි. | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සමඟ ඇති කර ගත් අවබෝධතා ගිවිසුමේ ප්‍රතිඵලයක් වශයෙන්, 2019 වර්ෂයේදී ලංසු කැඳවන ලදී. කෙසේ වුවද, ඉදිරිපත් කරන ලද ලංසුවල ලේඛනගත කිරීමේ දුර්වලතා හේතුවෙන් ලැබුණු ලංසු ප්‍රතික්ෂේප වූ අතර ජාතික අයවැය චක්‍රලේඛ 5/2019 මගින් 2019 වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන වියදම් සීමා කිරීම හේතුවෙන් අභ්‍යන්තර සැලසුම් ඉදිකිරීම් ක්‍රියාවලියේ ප්‍රගතිය තවදුරටත් ප්‍රමාද විය.<br><br>2020 වර්ෂය අවසාන භාගයේදී, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව නැවත උපදේශකයින් ලෙස පත් කිරීමත් සමඟ අභ්‍යන්තර සැලසුම් කටයුතු නැවත ආරම්භ විය. සවිස්තරාත්මක භූමි සැලැස්ම අවසන් කිරීම සහ බෙදා වෙන් කිරීමේ කාර්යයේ ඉදිකිරීම් පිරිවැය විශ්ලේෂණය කිරීම සහ වසර තුළදී කල් බදු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් වසර තුළදී ද බෙදා වෙන් කිරීමේ කටයුතු සඳහා ලංසු කැඳවා ඇත. කෙසේ වුවද, ලැබුණු ලංසු | නියමිත කාලසීමාව තුළ කාර්යය සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| | ඇගයීමේදී, 2021 වර්ෂයේ දී ජාතික අයවැය චක්‍රලේඛ 2/2021 සහ 3/2021 මගින් සහ 2022 වර්ෂයේ දී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 4/2022 මගින් රජය විසින් ප්‍රාග්ධන වියදම් සීමා කිරීම හේතුවෙන් පරිශ්‍රය මිලදී ගැනීමෙන් පසු දෙවන වතාවට අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු නතර කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ට සිදු විය. | |
| (ආ) මණ්ඩලය විසින් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම 2021 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර 2022 දෙසැම්බර් 31 දක්වා රු.20,158,000 ක් මේ සඳහා වැය කරන ලදී. සවිස්තරාත්මක මෘදුකාංග තාක්ෂණික ලේඛන (DSTD), පරීක්ෂණ සැලැස්ම සකස් කිරීම, පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) නිර්ණායක ලේඛනය සකස් කිරීම සහ MIS හි මූලික නොවන මොඩියුලවලට අදාළ විධිමත් අනුමත කිරීම් වැනි කාර්යයන් පමණක් සම්පූර්ණ කර ඇත. කෙසේ වුවද, පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන්, අපේක්ෂිත සමාලෝචන අරමුණු සඳහා එය භාවිතා කිරීමට 2023 මැයි මස අවසානය දක්වා ද නොහැකි වී තිබුණි. | උපදේශකයින් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) පද්ධතිය සඳහා අනුග්‍රහකය ඔවුන්ගේ Lanka Government Cloud (LGC 2.0) හි නොමිලේ ලබා දීමට එකඟ වී ඇත. LGC 2.0 සම්පත් භාවිතය එහි උපරිම මට්ටමට භාවිතා කිරීම සහ ඔවුන්ගේ සම්පත් පුළුල් කිරීමට ඔවුන්ට හැකියාවක් නොමැති බැවින්, දැනට පවතින MIS සඳහා අනුග්‍රහක පහසුකම් සැපයීමට ඔවුන්ට නොහැකි වීම පිළිබඳව ඔවුන් විසින් පසුව දැනුම් දෙන ලදී. කෙසේ වුවද, මාස 3 ක් ගතවූ පසු, ICTA විසින් ඉල්ලා තිබූ LGC 2.0 වේදිකාව ලබා දීමට එකඟ විය.<br><br>ඒ අනුව, එකී මාස 3 ක කාලය තුළ, මෘදුකාංග සංවර්ධක විසින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ව්‍යාපෘතිය සඳහා වෙන් කළ කාර්ය මණ්ඩලය වෙනත් ව්‍යාපෘති සඳහා යොදවා ඇති අතර, ICTA වෙතින් LGC පහසුකම ලැබීමෙන් පසු, එම කාර්ය මණ්ඩලය නැවත ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි MIS ව්‍යාපෘතිය සඳහා නැවත යොදවන ලද අතර එම කාර්ය මණ්ඩලය වර්තමානයේ ව්‍යාපෘති දෙකේම එකවර සේවයේ යෙදී සිටිති.<br><br>මීට අමතරව, සංවර්ධක විසින් සපයන ලද පැහැදිලි කිරීම්වලට අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. යේ MIS හි ඇති සුවිශේෂත්වය සහ සංකීර්ණත්වය හේතුවෙන්, කාලසටහන RFP තුළ මුලින් ප්‍රක්ෂේපණය කළ කාලය ඉක්මවා ඇති අතර ව්‍යාපෘතියේ කාලසීමාව මුලින් සැලසුම් කළ ව්‍යාපෘති කාලරාමුව ඉක්මවා යාමට ද එය හේතු වී ඇත. | නියමිත කාලසීමාව තුළ කාර්යය සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු 17ක් පැවතුණි. එයින් පුරප්පාඩු 15 ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් බලපෑමක් සිදු කළ හැකි විධායක මට්ටමේ පුරප්පාඩුය. | වරලත් ගණකාධිකාරීවරුන් සඳහා රජයේ වැටුප් පරිමාණ යටතේ පිරිනමනු ලබන අඩු වැටුප් හේතුවෙන් සුදුසු කාර්ය මණ්ඩලයක් රඳවා තබා ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. අසමත් වී තිබුණි. 2021 ජූනි 21 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් පුරප්පාඩු පිරවීම සඳහා තාක්‍ෂණිකව සුදුසු වරලත් ගණකාධිකාරීවරුන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට හැකි වන පරිදි ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සඳහා වැටුප් පරිමාණයක් අනුමත කර ඇත. කෙසේ වුවද, එම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) එකඟතාවය ඇතිව බඳවා ගැනීමේ පටිපාටි (SoR) සම්මත කිරීම අවශ්‍ය වූ අතර, එම අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමත කර ඇති වැටුප් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (MSD) සහාය නොදක්වන ලද අතර රජයේ වැටුප් සමඟ සමපාත වීම සඳහා එම වැටුප් අඩු කරමින් සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | අනුමත කිරීම් ලැබීමෙන් පසුව, යෝග්‍ය කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට වහාම කටයුතු කළ යුතු වීම. |
| (ආ) අධ්‍යක්ෂ ජනරාල් තනතුර කොන්ත්‍රාත් පදනම මත ලබා දී තිබුණි. එබැවින් ස්ථිර අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු නොමැතිවීම මණ්ඩලයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට බාධාවක් වනු ඇත. | 2020 වර්ෂයේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා බඳවා ගන්නා අවස්ථාවේ දී, වැටුප් පරිමාණ සංශෝධනය භාණ්ඩාගාර ලේකම්වරයා සමඟ සාකච්ඡා කිරීමේ අදියරේ පැවති අතර ඉන් අනතුරුව, කෙටි කලකින් එම අදියර අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී. ඒ අනුව, වැටුප් පරිමාණය සංශෝධනය කිරීම අවසන් වන තුරු, තාවකාලික කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීමට මණ්ඩලය තීරණය කර තිබුණි.<br><br>මේ වන විට මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡා මට්ටමේ පවතින, කැබිනට් අනුමැතිය ලත් වැටුප් පරිමාණය සම්බන්ධ කටයුතු අවසන් කිරීමත් සමඟ මෙම ගැටළුව විසඳා ගැනීමට අපේක්ෂා කෙරේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. |
| (ඇ) අනුමත කාර්ය මණ්ඩලයේ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරක් | සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු ඉදිරියට සිදු කරගෙන යාම සඳහා | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට |

| | | |
|---|---|---|
| පැවතිය ද, එය මණ්ඩලයේ ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවතුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා වන බඳවා ගැනීමේ පටිපාටි (SoRs) අනුමත කිරීම අවශ්‍ය වේ. | අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. |
| (ඇ) සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික සඳහා සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව 2023 මැයි මස අවසානය වන තෙක් ලැබී නොතිබුණි. | ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් සම්පව පසු විපරම් කටයුතු සිදු කළද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීමේ පටිපාටි (SoRs) අනුමත කර නොතිබුණි. | මෙම ක්‍රියාවලිය කඩිනම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. |